## සංක්ෂිප්තය

විදුහල්පතිගේ නායකත්වය සෘජුව ම පාසලක සංවර්ධනය කෙරෙහි බලපෑම් සිදු කරයි. මෙම නායකත්වය ගුරු කේන්ද්‍රීය වීම මගින් ගුරු අභිප්‍රේරණය සිදු වන නිසා ඉහළ කාර්ය උද්යෝගයක ගුරු මණ්ඩලය තුළ ගොඩනැංවෙන අතර ඵලදායී අධ්‍යාපනයක් පාසල තුළ ස්ථාපිත වේ. මෙම පර්යේෂණයේ ප්‍රධාන ප්‍රස්තුතය ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල විදුහල්පතිවරුන්ගේ උපදේශන නායකත්වයේ ස්වභාවය අධ්‍යයනය කිරීම වේ. ඒ අනුව, පාසල්වල විදුහල්පතිවරුන්ගේ උපදේශන නායකත්ව භූමිකාවේ කාර්යභාරය හඳුනා ගැනීම, පාසල්වල උපදේශන නායකත්ව භූමිකාව ක්‍රියාත්මක කිරීම තුළින් හිමිවන ප්‍රතිලාභ හඳුනා ගැනීම, උපදේශන නායකත්ව භූමිකාව ක්‍රියාත්මක ස්වරූපයේ ඇති ප්‍රබලතා හඳුනා ගැනීම, පාසල්වල උපදේශන නායකත්වය සැපයීමේදී විදුහල්පතිවරුන්ට මුහුණ දීමට සිදුවන අභියෝග හඳුනා ගැනීම සහ එම අභියෝග ජය ගැනීමට යෝජනා ඉදිරිපත් කිරීම යන අරමුණු ඔස්සේ මෙම අධ්‍යයනය සිදු කරන ලදි. අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමය ලෙස විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශය යටතේ පවතින සමීක්ෂණ පිරිසැලසුම භාවිත කළ අතර පර්යේෂණ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස නියැදිකරණ ක්‍රම ශිල්ප භාවිත කරමින් නියැදිය සහ දත්ත රැස් කරන ක්‍රම ශිල්ප සහ උපකරණ යොදා ගන්නා ලදි. වැල්ලවාය අධ්‍යාපන කලාපයේ පාසල් 15ක් පාසල් නියැදිය ලෙස යොදා ගත් අතර විදුහල්පතිවරු සහ නියෝජ්‍ය විදුහල්පතිවරු, 15 බැගින් ද ගුරුවරුන් 75 ක් ද ලෙස බහුවිධ නියැදි දත්ත රැස් කිරීමට භාවිතා විය. විදුහල්පතිවරුන්ගෙන් සම්මුඛ සාකච්ඡාවක් මගින් ද නියෝජ්‍ය විදුහල්පතිවරු සහ ගුරුවරුන්ගෙන් ප්‍රශ්නාවලි අනුසාරයෙන් ද දත්ත රැස් කළ අතර ලේඛන සමීක්ෂණ ද යොදා ගන්නා ලදි. රැස් කළ තොරතුරු ප්‍රමාණාත්මක ව සහ ගුණාත්මක ව විශ්ලේෂණය කර ප්‍රතිශත සහ සරල සංඛ්‍යාන ක්‍රම යොදා ගනිමින් අර්ථකථනය කරන ලදි. පර්යේෂණයට අදාළ සාහිත්‍ය විමර්ශනය න්‍යායාත්මක සහ ආනුභවික වශයෙන් ද සිදු කෙරිණ. න්‍යායාත්මක විමර්ශනයේ දී උපදේශන නායකත්ව න්‍යායයන් විමසුමට ලක් කරන ලදි. විදුහල්පතිවරුන්ට පාසල තුළ නායකත්වය පවත්වා ගැනීමට උපදේශන න්‍යායයන් කොතරම් දුරට උපයෝගී කර ගත හැකි ද යන්න ඒ යටතේ සාකච්ඡා කරන ලදි. ආනුභවික සාහිත්‍ය විමර්ශනය මගින් විදුහල්පතිවරුන්ගේ විවිධ නායකත්ව ශෛලීන් හඳුනා ගැනීම පිණිස පර්යේෂකයන් සිදු කර ඇති අධ්‍යයන, විදුහල්පතිගේ නායකත්වය පිළිබඳ ගුරු සංජානනය, විදුහල්පතිවරුන්ට උපදේශන නායකත්වය පිළිබඳ පවතින ස්වයං අවබෝධය, ගුරු තෘප්තිය කෙරේ නායකත්ව බලපෑම, ගුරු වෘත්තිය කාර්යඵලය කෙරේ නායකත්ව බලපෑම සහ පාසල් ඵලදායීතාව කෙරේ

නායකත්ව ශෛලීයේ බලපෑම සාකච්ඡාවට ලක් කරන ලදී. මෙම අධ්‍යයනයේ අනාවරණ පර්යේෂණ අරමුණුගත ව ඉදිරිපත් කරන ලදී. විදුහල්පතිවරුන් ප්‍රධාන වශයෙන් ස්වකීය නායකත්වය තුළ අවධානය යොමු කරන්නේ පරිපාලනය හා භෞතික සම්පත් සංවර්ධනය මෙන් ම මූල්‍ය කළමනාකරණය වෙනුවෙනි. සිසු හා ගුරු සංවර්ධනය කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු නොවන අතර මානව සම්පත් හා කාලය කළමනාකරණය පිළිබඳව ද සතුටු විය නොහැක. මෙම ගැටලු නිරාකරණයට විසඳුම් ලෙස විදුහල්පතිවරුන් සඳහා පුහුණුව ලබා දීම, කාර්යභාරය ලිඛිතව පැවරීම, විදුහල්පති දිරි දීමනා ලබා දීම, පාසල්වලට ප්‍රමාණවත් සම්පත් සැපයීම මෙන් ම දේශපාලනය පාසලෙන් ඉවත් කිරීම පිළිබඳ ව යෝජනා විය.

**Abstract**

The leadership of the principal directly influence for the development of a school. As this leadership is motivated by being teacher-centered , highly motivated teachers are built up within the staff and an effective education is established in the school. The main objective of this research is to study the nature of instructional leadership of principals in government schools in Sri Lanka. This research was carried out based on, to identify the duty of principals' instructional leadership role, to identify the benefits of implementing a instructional leadership role in schools, to identify the strengths in active role of the instructional leadership, to identify .the challenges faced by the principals in providing instructional leadership and to make suggestions to overcome those challenges. The survey layout under the detailed research approach has been used as the research method of this study while the sample through modeling methodologies , data collecting methodologies and equipments have been employed in order to meet the research objectives. 15 schools in Wellawaya education zone have been used as the sample while principals ,15 deputy principals , 75 teachers have been used to collect multiple sample data. Data has been collected through an interview from principals and through questionnaire from deputy principals and teachers. Document surveys also have been used. After a quantitative and qualitative analysis, collected information has been analysed using percentages , table graphs and simple statistics. The literary review related to this research has been done theoretically and empirically. Instructional leadership principles have been examined in the theoretical review .Under this it has been discussed to which extent counseling principles can be used to maintain leadership with in the school. In the empirical review it has been discussed about the studies conducted by researchers to identify different leadership styles of principals , perception of the principals' leadership , principals' self-awareness on instructional leadership, influence of leadership on teacher satisfaction , influence of leadership on the performance of the teaching profession and the impact of leadership on school productivity.

The outcomes of this study have been submitted based on researches. In their leadership,Principals mainly focus their attention on administration ,development of physical resources and financial management. Less attention has been given to student and teacher development and also cannot be satisfied with the human resources and time management. Providing training for principals , assign duties in written form , providing principal incentives, providing necessary resources and removing politics from schools have been suggested as solutions for these problems.